පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண சமூக சேவைகள் திணைக்களம் - வடமத்திய மாகாணம்
PROVINCIAL DEPARTMENT OF SOCIAL SERVICES – NORTH CENTRAL PROVINCE
372, ධර්මපාල මාවත, අනුරාධපුර. இல 372,தர்மபால மாவத்தை, அநுராதபுரம் NO. 372, Dharmapala Mawatha, Anuradhapura

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director — 025 - 2234673 | කාර්යාලය / அலுவலகம் / Office — 025 - 2224173 | ෆැක්ස් / பெக்ஸ / Fax — 025 - 2225316 |
| මගේ අංකය / எனது இலக்கம் / My No. — NCP/SS/E1/ | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | දිනය / திகதி / Date — 2016/08/22 |


පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2016/02.

උතුරු මැද පළාතේ සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන්,
උතුරු මැද පළාතේ සමාජ සේවා නිලධාරින් වෙත,

<u>තැලසීමියා රෝගීන් සඳහා වන ඇටමිදුළු බද්ධ කිරීමේ ශල්‍යකර්ම සඳහා ශල්‍යකර්ම ආධාර ලබා දීම</u>

පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් ආධාර ලබා දෙන රෝග අතර, දරුණු රෝගයක් වන තැලසීමියා රෝගයට අඛණ්ඩව ප්‍රතිකාර ලබා දීම රුධිරය හා එන්නත් ලබා දීම ආදිය නිරන්තරයෙන් සිදුකළ යුතුව පවතින්නකි.

02. මේ හේතුවෙන් මාසිවක රුධිරය මාරු කිරිම සඳහා දින ගණනක් රෝහල් ගත කිරිම රුධිරයේ යකඩ සාන්ද්‍රණය පාලනය සඳහා අවශ්‍ය ඖෂධ ලබා දීම යන කටයුතු සඳහා මාසිකව විශාල මුදලක් වැය කිරීමට සෞඛ්‍ය ක්ෂේත්‍රයට සිදුව තිබේ. මෙම මුදල් රජයේ සේවකයින් වුවත්, නොවූවත් දැරීමට සිදු වේ.

03. මෙම රෝගී තත්ත්වයට දරුවෙකු ලක්වීම තුළ එම පවුලට මෙම ප්‍රතිකාර නිරන්තරයෙන් කිරීමට සිදු වීම හේතුවෙන් එම පවුලේ සමස්ථ ආර්ථිකයම බිඳ වැටීම වැළැක්වීමට නොහැක. මේ නිසා ඇටමිදුළු බද්ධ කිරීමේ ශල්‍ය කර්මය සඳහා තෝරා ගනු ලබන අඩු ආදායම්ලාභී රෝගීන් සඳහා ලක්ෂ 05 ක ආධාර මුදලක් ලබා දීම 2016.01.15 දින අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 2016/02 යටතේ අනුමැතිය ලැබී ඇත.

04. එබැවින් උතුරුමැද පළාත තුළ රාජ්‍ය සේවයේ සහ ත්‍රිවිධ හමුදා, පොලිස් හා සිවිල් ආරක්ෂක සේවයේ නියුතු සියලුම නිලධාරීන්ගේ <u>ආදායම් තත්ත්වය නොසලකා</u> ලක්ෂ 05 ක ආධාර මුදලක් ලබා දීමට අමාත්‍ය මණ්ඩල සංදේශ අංක (2016/64) සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මෙම චක්‍රලේඛනය නිකුත් කරන ලදී.

05. මෙම ලක්ෂ 05 ක ආධාර මුදල රෝගියා රෝහල්ගත කළ පසු අදාළ රෝහලෙන් විමසීමක් කර, රෝහල වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ.

එස්.එස්.එම්.සම්පත් රෝහණ ධර්මදාස,
පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ
උතුරු මැද පළාත.

එස්.එස්.එම්. සම්පත් රෝහණ ධර්මදාස
පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ
උතුරු මැද පළාත.